WORKED.

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය
## අති විශෙෂ

අංක 11,460 — 1958 ජූලි 28 වැනි සඳුද — 28.7.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය
## මිල පාලන දැන්වීම්

එන්/ඊ 37 දරන ආහාර මිල නියෝගය.

කරවල සහ වියළි ඉස්සෝ

**1950 අංක 29 දරණ මිල පාලන පනත**

**නියෝගය**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ උප ආහාර මිළ පාලක කැන්පත් ආතර් කත්බට් බතෝලමියුස් වන මම, 1950 අංක 29 දරන මිල පාලන පනතේ අංක 3 (2) දරන කොටස සමග කියවෙන අංක 4 දරන කොටසින් මා වෙත පැවරී ඇති බලතල අනුව, මෙම නියෝගයෙන්—

(1) මෙහි ''ඒ'' දරන උප ලෙඛනයෙහි පළමුවැනි තීරයේ විස්තර කරන ඊට අදළ ප්‍රදේශයන් තුළ මෙහි ''ඒ'' දරන උපලෙඛනයෙහි අංක 2 සිට 21 දක්වා ඇති තීර ශීර්ෂයන්හි නියමිත ද්‍රව්‍ය තොග වශයෙන් හොණ්ඩරයක් විකිණිය හැකි ඉහළම දළ තොග මිළ මෙහි ''ඒ'' උපලෙඛනයෙහි අංක 2 සිට 21 දක්වා තීරයන්හි නියමිත මිළ ලෙස මේ මොහොතේ සිට වලංගු වන මෙන් නියම කරමි.

(2) මෙහි ''බී'' දරන උප ලෙඛනයෙහි විස්තර කරන ඊට අදල ප්‍රදේශයන් තුළ මෙහි ''බී'' දරන උප ලෙඛනයෙහි 2 සිට 13 දක්වා තීරයන්හි නියමිත මිළ මෙහි ''බී'' දරන උප ලෙඛණයෙහි 2 සිට 13 දක්වා තීර ශීර්ෂයෙහි නියමිත ද්‍රව්‍යයන් රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි ඉහළම ශුද්ධ මිළ ලෙස මේ මොහොතේ සිට වලංගු වන මෙන් නියම කරමි.

(3) මේ නියෝගයේ අවශ්‍යතාවය සඳහා—

(අ) නැවත විකිණීමක් වශයෙන් ''ඒ'' සහ ''බී'' දරන උප ලෙඛනයන්හි පිළිවෙලින් 2 සිට 21 සහ 2 සිට 13 දක්වා තීරයන්හි නියමිත ද්‍රව්‍යයක කිසියම් ප්‍රමාණයක කිසියම් විකිණීමක් හෝ ''ඒ'' සහ ''බී'' දරන උප ලෙඛනයන්හි පිළිවෙලින් 2 සිට 21 සහ 2 සිට 13 දක්වා තීරයන්හි නියමිත ද්‍රව්‍යයන් දළ හොණ්ඩරයකට හෝ වැඩි ප්‍රමාණයකින් එක් වරකට විකිණීමක් තොග වශයෙන් විකිණීමක් ලෙස සල්කනු ලැබේ, යයි ද,

(ආ) ''ඒ'' සහ ''බී'' දරන උපලෙඛණයන්හි පිළිවෙලින් 2 සිට 21 සහ 2 සිට 13 දක්වා තීරයන්හි නියමිත ද්‍රව්‍යයන් දළ හොණ්ඩරයකට අඩු ප්‍රමාණයකින් පරිභෝගය සඳහා හෝ ප්‍රයෝජනය සඳහා කිසියම් ප්‍රමාණයකින් විකිණීම සිල්ලරට විකිණීමක් ලෙස සලකනු ලැබේ යයි ද නියම කරමි.

(4) මේ නියෝගයෙන් ඉහළම මිළ නියම කරන ලද හැම ප්‍රදේශයක් තුළම ''ඒ'' සහ ''බී'' උපලෙඛනයන්හි 2 සිට 21 සහ 2 සිට 13 දක්වා තීරයන්හි නියමිත ද්‍රව්‍ය වෙනත් ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කොට විකිණීම නොකළ යුතු බව මෙයින් නියම කරමි.

(5) මේ නියෝගයෙන් ඉහළම මිළ ගණන් නියම කර ඇති හැම ප්‍රදේශයක් තුළම ''ඒ'' සහ ''බී'' උපලෙඛනයන්හි පිළිවෙලින් 2 සිට 21 සහ 2 සිට 13 දක්වා විස්තර කරන ලද ද්‍රව්‍යයක් සතුව හෝ සිය පාලනය යටතේ කිසියම් ස්ථානයක හෝ කිසියම් වාහනයක තබා ගෙන ඇති සැම වෙළෙන්දාම ''ඒ'' සහ ''බී'' උපලෙඛනයන්හි පිළිවෙලින් 2 සිට 21 දක්වාත් 2 සිට 13 දක්වාත් ඇති තීරයන්හි විස්තර කරන ලද ඒ ඒ ද්‍රව්‍යයේ මේ නියෝගයෙන් නියමිත ඉහළම මිළ සඳහා දැන්වීමක් ඒ ඒ ස්ථානයෙහි හෝ වාහනයෙහි පැහැදිලිව පෙනෙන සේ තැබිය යුතුය.

(6) මේ නියෝගයේ අවශ්‍යතාවය සඳහා රාත්තල හෝ ''රා.'' යන්න සම්මත එවර්දුපොයිස් රාත්තලේ බර ලෙස සැලකෙන ලෙසද අවුන්සය හෝ ''අවු'' සම්මත එවර්දුපොයිස් අවුන්සයේ බර ලෙස සැලකෙන ලෙසත් නියම කරමි.

(7) මේ නියෝගයේ ඉහළම මිල නියමකර ඇති හැම ප්‍රදේශයක් තුළම ''ඒ'' සහ ''බී'' උපලෙඛනයන්හි පිළිවෙලින් 2 සිට 21 සහ 2 සිට 13 දක්වා තීරයන්හි විස්තර කර ඇති ද්‍රව්‍ය තොග වශයෙන් විකුණන හැම පුද්ගලයකු විසින්ම ''ඒ'' සහ ''බී'' උප ලෙඛනයන්හි පිළිවෙලින් 2 සිට 21 සහ 2 සිට 13 දක්වා තීරයන්හි විස්තර කරන ලද ද්‍රව්‍ය සිල්ලර වශයෙන් විකුණන හැම පුද්ගලයකු විසින් ම ද මිල දී ගන්නා විසින් ඉල්ලන ලද විටක පහත සඳහන් කරුණු ඇතුළත් කුවිතාන්සියක් දිය යුතු ය :—

(8) (අ) විකිණීමේ දිනය;

(ආ) විකුණන ලද ප්‍රමාණය සඳහා ගෙවන ලද මිල ;

(ඉ) විකුණන ලද ද්‍රව්‍යයේ ප්‍රමාණය (බරින්) ;

(ඊ) ගනුදෙනුවේ තත්ත්වය, එනම් විකිණීම තොග වශයෙන්ද සිල්ලර වශයෙන් ද යන්න.

(9) ''ඒ'' සහ ''බී'' දරන උප ලෙඛන යන්හි පිළිවෙලින් 2 සිට 21 ද 2 සිට 13 ද දක්වා තීරයන්හි විස්තර කරන ලද ද්‍රව්‍ය විකුණන අවස්ථාවක දී ''ඒ'' සහ ''බී'' දරන උප ලෙඛනයන්හි පිළිවෙලින් 2 සිට 21 ද 2 සිට 13 ද දක්වා තීරයන්හි සඳහන් මිලට ඒ ද්‍රව්‍ය විකිණීමට ගන්නා ද්‍රව්‍යයක වේ නම් එයද ඇතුළත් බව නියම කරමි. මෙම නියෝගය උඩහේවාහැට ආදායම් පාලක නිලධාරි තැනගේ කොට්ඨාශයෙහි වලංගු නොවේ.

1958 ජූලි 23 වෙනි දින පෙරවරු 11 ට නුවරඑළියේ කච්චේරියේදී අත්සන් කරන ලදී.

ඒ. සී. බතෝලමියුස්.
උප මිල පාලක තැන (ආහාර)
නුවරඑළිය දිස්ත්‍රික්කය.

2043—ජේ. ඇන්. ආර් 25261—4,052 (7/58)

## උපලේඛනය

**සොග වශයෙන් විකිණීමේ දී දළ බර හොණ්ඩරයක වැඩිම මිල**

| 1 වෙනි තීරය | 2 හිස රහිත තෝර | 3 හිස සහිත තෝර | 4 හිස රහිත කට්ටා | 5 කට්ටා සම්පූර්ණයෙන් | 6 හිස සහිත ලොකු අන්ජිලා | 7 හිස රහිත ලොකු අන්ජිලා | 8 හිස සහිත කුඩා අන්ජිලා | 9 හිස රහිත කුඩා අන්ජිලා | 10 ලොකු හාල් මැස්සෝ | 11 කුඩා හාල් මැස්සෝ | 12 හිස රහිත පරව් | 13 හිස සහිත පරව් | 14 කුම්බලා | 15 බොම්බිලි | 16 හිස රහිත කොඩුවා | 17 හිස සහිත කොඩුවා | 18 කෝන්ඩ | 19 බලයා | 20 ලෙලි රහිත වියලි ඉස්සෝ | 21 ලෙලි සහිත වියලි ඉස්සෝ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. නුවරඑළිය (නාගරික සහා ප්‍රදේශය) ...<br>2. කඳපොල ... ...<br>3. නානුඔය ... ...<br>4. රම්බොඩ වටුම ... ...<br>5. සංගිලි පාලම ... ...<br>6. කුඩා ඔය ... ...<br>7. පුන්ඩලුඔය ... ...<br>8. කිස්පනෝ කෝරලේ ... ...<br>9. පල්ලෙපනෝ කෝරලේ ...<br>10. මොරපේ ... ...<br>11. වලිකෝල්ට් ... ...<br>12. ඩයගම ... ...<br>13. ආගරපතන ... ...<br>14. මැදපනෝ ගම්කායයි සහා ප්‍රදේශය ... | 120 62... | 101 74... | 89 15... | 68 17... | 68 18... | 72 58... | 55 59... | 59 78... | 97 54... | 55 59... | 99 64... | 80 76... | 28 84... | 80 76... | 89 15... | 64 83... | 68 17... | 89 15... | 121 09... | 95 44 |
| 15. රාගල ... ...<br>16. උඩපුස්සැල්ලාව ... ... | 121 14... | 102 18... | 89 54... | 68 47... | 68 48... | 72 90... | 55 83... | 60 04... | 97 97... | 55 83... | 100 7... | 81 11... | 28 97... | 81 11... | 89 54... | 65 11... | 68 47... | 89 54... | 121 67... | 95 86 |
| 17. නිලදණ්ඩාහින්න ... ...<br>18. හරස්බැද්ද ... ...<br>19. වලපනේ ... ...<br>20. කුඹුල්ගමුව ... ... | 122 90... | 103 66... | 90 84... | 69 46... | 69 47... | 73 95... | 56 64... | 60 91... | 99 39... | 56 64... | 101 52... | 82 29... | 29 39... | 82 29... | 90 84... | 66 5... | 69 46... | 90 84... | 123 43... | 97 25 |
| 21. දිඹුල ... ...<br>22. වටගොඩ ... ...<br>23. තලවකැලේ ... ...<br>24. ලිඳුල ... ...<br>25. වලහා ... ...<br>26. කොටගල ... ... | 119 21... | 100 55... | 88 11... | 67 38... | 67 39... | 71 73... | 54 94... | 59 09... | 96 41... | 54 94... | 98 48... | 79 82... | 28 51... | 79 82... | 88 11... | 64 7... | 67 38... | 88 11... | 119 73... | 94 33 |

**සැලකිය යුතුයි.**—මේ මිල ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිල නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිල ගණන්ය. මේ මිල ගණන්වලට ඉහලින් ඒ ඒ ද්‍රව්‍ය විකිණිය නොහැකිය.

## උපලේඛනය " බී "

### සිල්ලර වශයෙන් විකිණීමේ දී දළ බර රාත්තලක වැඩිම මිල

| 1 වෙනි තීරය | 2 තෝර | 3 කට්ටා | 4 අන්ජිලා | 5 හාල් මැස්සෝ | 6 පරව් | 7 කුම්බලා | 8 බොම්බිලි | 9 කොඩුවා | 10 තොන්ඩ | 11 බලයා | 12 පොතු රහිත වියලි ඉස්සෝ | 13 පොතු සහිත වියලි ඉස්සෝ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. නුවරඑළිය (නාගරික සභා ප්‍රදේශය) ... | | | | | | | | | | | | |
| 2. නානුඔය ... ... ... | | | | | | | | | | | | |
| 3. කඳපොල ... ... | | | | | | | | | | | | |
| 4. රාගල ... ... | | | | | | | | | | | | |
| 5. උඩපුස්සැල්ලාව ... ... | | | | | | | | | | | | |
| 6. රම්බොඩ වවුම ... ... | | | | | | | | | | | | |
| 7. සංගිලිපාලම් ... ... | | | | | | | | | | | | |
| 8. කුඩාඔය ... ... | | | | | | | | | | | | |
| 9. පුන්ඩලුඔය ... ... | | | | | | | | | | | | |
| 10 තිස්පනේ කෝරලේ ... ... | | | | | | | | | | | | |
| 11. පල්ලෙපනේ කෝරලේ ... | | | | | | | | | | | | |
| 12. මොරපෙ ... ... | 1 36 ... | 1 5 ... | 0 84 ... | 1 10 ... | 1 10 ... | 0 31 ... | 0 94 ... | 1 0 ... | 0 73 ... | 1 0 ... | 1 15 ... | 0 89 |
| 13. ටිලිකෝල්ට්‍රි ... ... | | | | | | | | | | | | |
| 14. ඩයගම ... ... | | | | | | | | | | | | |
| 15. ආගරපතන ... ... | | | | | | | | | | | | |
| 16. මැදපනේ (ගම්කාර්‍ය සභා ප්‍රදේශය) ... | | | | | | | | | | | | |
| 17. දිඹුල ... ... | | | | | | | | | | | | |
| 18. වටගොඩ ... ... | | | | | | | | | | | | |
| 19. තලවකැලේ ... ... | | | | | | | | | | | | |
| 20. ලිඳුල ... ... | | | | | | | | | | | | |
| 21. වලහ ... ... | | | | | | | | | | | | |
| 22. කොටගල ... ... | | | | | | | | | | | | |
| 23. අඹේවෙල ... ... | | | | | | | | | | | | |
| 24. නිල්දණ්ඩාහින්න ... ... | | | | | | | | | | | | |
| 25. හරස්බැද්ද ... ... | 1 40 ... | 1 8 ... | 0 86 ... | 1 14 ... | 1 14 ... | 0 32 ... | 0 97 ... | 1 3 ... | 0 76 ... | 1 3 ... | 1 19 ... | 0 92 |
| 26. වතුමුල්ල ... ... | | | | | | | | | | | | |
| 27. කුඹල් ගමුව ... ... | | | | | | | | | | | | |
| 28. රූපහ ... ... | 1 41 ... | 1 9 ... | 0 87 ... | 1 15 ... | 1 15 ... | 0 33 ... | 0 98 ... | 1 4 ... | 0 77 ... | 1 4 ... | 1 20 ... | 0 93 |

සැලකිය යුතුය.—මේ මිල ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිල නොවේ. ඒවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි උපරිම වැඩි මිල ගණන්ය. මේ මිළ ගණන්වලට ඉහලින් ඒ ඒ ද්‍රව්‍ය විකිණිය නොහැකිය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.